1

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. HRC/169/19 | දිනය / திகதி / Date 2022.02.07 |

පැමිණිලි පාර්ශවය : කේ.එන්.දෙව්ෂානි මිය.
අංක : 101/91.
111 වන මාවත.
අලුත්වත්ත. හලාවත.

වගඋත්තර පාර්ශවය : 01 විදුහල්පති.
ශාන්ත මරියා බාලිකා ප්‍රාථමික විදුහල.
හලාවත.

02 රේණුකා කොස්තා මිය
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.
කලාප අධ්‍යාපන කාර්යාලය.
හලාවත.

**<u>පැමිණිලි අංකය : HRC/169/19</u>**

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකාරිය මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති සිය පැමිණිල්ලෙන් ප්‍රකාශ සිටින්නේ තම දියණිය වන දිනිති නවෝද්‍යා ප්‍රේමරත්න දැරිය හලාවත ශාන්ත මරියා බාලිකා ප්‍රාථමික විදුහලේ පළමු ශ්‍රේණිය සඳහා 2019 වසරේ ඇතුළත් කර ගැනීමට පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළ බවත්, එම අයදුම් පත්‍රයට අනුව පැමිණිලිකාරිය කතෝලික ආගමට අයත් තැනැත්තියක ලෙස අදාල සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට මුළු ලකුණු 71.5 ක ප්‍රමාණයක් ලබා ගෙන ඇති බවත්, සම්මුඛ පරීක්ෂණය අවසන් වීමෙන් පසුව ප්‍රසිද්ධ කරන ලද තාවකාලික ලේඛනයේ තම දියණියගේ නම ඇතුළත් නොවූ බැවින් ඒ සම්බන්ධයෙන් අදාල පාසල වෙත අභියාචනයක් ඉදිරිපත් කළ බවත්, එම අභියාචනය ඉදිරිපත් කිරීම මගින් ද තම දියණිය ඉහත පාසලට ඇතුළත් කර ගැනීමට

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் — 011-2505451
ෆැක්ස් / தொலைநகல் — 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் — sechrcsl@gmail.com

අවස්ථාව හිමිවී නොමැති බවත් කෙසේ වෙතත් ඒ සම්බන්ධයෙන් පාසල වෙතින් විමසීමේදී තමන්ට දැනගන්නට ලැබුණේ තමන් කතෝලික ආගමට අයත් නොවන බැවින් තම දියණිය ඉහත පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට අවස්ථාවක් නොමැති බවට පාසලේ විදුහල්පතිනි ඇතුළු පාසල් පරිපාලනය විසින් තමන් වෙත ප්‍රකාශ කළ බවත්ය.

පැමිණිලිකාරිය විසින් වැඩිදුරටත් කරුණු දක්වමින් තමා සහ දියණිය කතෝලික පවුලකට අයත් සාමාජිකයින් බවත්, තම දියණිය කතෝලික සභාවේ පළමු සක්‍රමේන්තුව වන ප්‍රසාදස්නාපය ද ලබා ඇති බව ප්‍රකාශ කරයි. එබැවින් තම දියණිය කතෝලික ආගමට අයත් නොවන බව පවසමින් ඉහත පාසලේ පළමු ශ්‍රේණියට 2019 වසරේ ඇතුළත් කර නොගැනීම මගින් පැමිණිල්ලේ පළමු වගඋත්තරකාර පාර්ශවය වන විදුහල්පතිනි ශාන්ත මරියා බාලිකා ප්‍රාථමික විදුහල හලාවත ඇතුළු පාසල් පරිපාලනය විසින් 2019 වසරේ රජයේ පාසල් වල පළමු ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමට අදාළ 24/2018 චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව කටයුතු කරමින් තම මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් කටයුතු කර ඇති බවත්ය.

**වගඋත්තරකාර පාර්ශවයන්ගේ කරුණු දැක්වීම :-**

ශාන්ත මරියා බාලිකා ප්‍රාථමික විදුහලේ විදුහත්පතිනිය වන බීටා තිසේරා පැවිදි සොයුරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2019.02.13 දිනැතිව වාර්තාවක් යොමු කර ඇති අතර, එකී වාර්තාව අනුව 2019 වසරේ තම පාසලේ පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති තමා නොවන බවත්, පැමිණිලිකාරියගේ දියණිය තම පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ අයදුම් පත්‍රයට අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද බවත්, අයදුම්කාරිය උපතින්ම රෝමානු කතෝලික වුවත් එම සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනට වසර දෙකකට පමණ පෙර සිට කතෝලික සභාවට අයත් නොවන මූලධර්මවාදී ක්‍රිස්තියානි සභාවකට සම්බන්ධව ඇති බවට දැනගන්නට ලැබී ඇති බවත්, ඇයගේ දියණිය තම පාසලට ඇතුළත් කර ගැනීම සඳහා පමණක් රෝමානු කතෝලික සභාවට පමණක් සුවිශේෂී වූ පවුල්පොත නම් ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කර ඇති බව අනාවරණය වී ඇති බව පවසයි. මෙම අයදුම්කාරිය රෝමානු කතෝලික නොවන බවට මීසම භාර පියතුමා විසින් ද තමන් වෙත දන්වා ඇති බව ප්‍රකාශ කර ඇත. මෙම ප්‍රාථමික විදුහල රජයට පවරා ගන්නා අවස්ථාවේ ඒ ඒ ආගම් වලට අනුව පහත පරිදි ප්‍රතිශත දක්වා ඇත. ඒ අනුව,

1. රෝමානු කතෝලික - 93.808
2. බෞද්ධ - 4.71
3. ඉස්ලාම් - 1.076

ක්‍රිස්තියානි (මූලධර්මවාදි) ආගම් සඳහා ප්‍රතිශතයක් නොමැත" වශයෙන් දක්වා ඇති අතර, එම ප්‍රතිශත වල ක්‍රිස්තියානි ආගම සඳහා ප්‍රතිශතයක් වෙන් කර නොමැති බව සහ 24/2018

චක්‍රලේඛය ප්‍රකාරව ද මෙම පාසලට පැමිණිලිකාරියගේ දියණිය ඇතුලත් කර ගැනීමේ නීතිමය ඉඩකඩක් නොමැති බවද සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් තමන් කටයුතු කර නොමැති බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ලට අදාලව 2019.06.10 දින පැවති පරීක්ෂණය සඳහා හලාවත අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වන එම්.ජී.එම්. සද්ධාමංගල මහතා ප්‍රකාශ කර ඇත්තේ 24/2018 චක්‍රලේඛය පරිදි අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින්, අභියාචනා විරෝධතා පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් කටයුතු කළයුත්තේ චක්‍රලේඛනයේ ප්‍රතිපාදන පරිදි බවත් පළාත් පාසල්වල එම මණ්ඩල සාමාජිකයින් පත් කිරීම සිදු කරනු ලබන්නේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් බවත්, එම තත්වය හේතුවෙන් මෙම ගැටළුවට තවදුරටත් මැදිහත් වීමට හලාවත කලාප අධ්‍යාපන කාර්යාලයට හැකියාවක් නොමැති බව ය.

**සාක්ෂිකරුවන්ගේ කරුණු දැක්වීම් :-**

මෙම පැමිණිල්ලට අදාලව 2019.11.28 දින කැඳවා තිබූ පරීක්ෂණය සඳහා ස්වේච්ඡාවෙන් සාක්ෂිකරුවෙකු ලෙස සහභාගී වී ඇති හලාවත ආසන දෙව් මැදුරෙහි මීසම භාර පාලක පියතුමා ලෙස කටයුතු කරන ඩිලාන් මේරියස් ප්‍රනාන්දු පියතුමා එදින පරීක්ෂණයේදී සහ පසුව ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මගින් ප්‍රකාශ කර ඇත්තේ තමන් 2018 ජනවාරි මස 09 වන දින සිට හලාවත ආසන දෙව් මැදුරේ මීසම් පාලක පියතුමා ලෙස හලාවත රදගුරු හිමිපානන් විසින් පත් කරන ලදුව මේ දක්වා කටයුතු කරමින් සිටින බවත්, තමන් විසින් හලාවත ශාන්ත මරියා බාලිකා ප්‍රාථමික විදුහලේ විදුහල්පති පැවිදි සොයුරිය වෙත 2018.10.30 දිනැතිව ලබාදී ඇති ලිපියේ සඳහන් සියලු කරුණු සත්‍ය සහ නිවැරදි බවත් ආසන දෙව් මැදුරේ 3 වන කොට්ඨාශයට අයත් කේ.එම්. දෙව්ශානි මහත්මියගේ දියණිය රෝමානු කතෝලික සභාවට අයත් නොවන ක්‍රිස්තියානි සභාවකට සම්බන්ධ වී කටයුතු කරමින් සිටින බැවින් ඇය තවදුරටත් රෝමානු කතෝලික සභාවට අයත් තැනැත්තියක් නොවන බව අදාල දිවුරුම් ප්‍රකාශය මගින් ප්‍රකාශ කර ඇත. ඊට අමතරව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ තමාගේ දැනුම අනුව මීසමේ කතෝලික සභාවේ කටයුතු වලට මෙම පැමිණිලිකාරිය ඇතුළු පවුලේ අය සහභාගී නොවන බවත් තමාගේ අනුදැනුමින් තොරව නිල පවුල්පොත පවත්වාගෙන ගොස් ඇති බවත්, ප්‍රදේශයේ කතෝලික පවුල් වලින් තමා දැනගත් කරුණු අනුව වසර දෙකක කාලයක සිට මෙම පවුලේ අය වෙනත් ක්‍රිස්තියානි සභාවකට සම්බන්ධ වී කටයුතු කරන බවත්, මෙම පරීක්ෂණය සඳහා තමන් ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වී ඉදිරිපත් කරන ප්‍රකාශය සහ ස්ථාවරය ඉදිරියටත් ආරක්ෂා කරන බවත්, මෙහිදී තමා විදුහල්පති පැවිදි සොයුරිය ආරක්ෂා කිරීමට කූඨ ලේඛන සකස් කර නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

**විමර්ශනය :-**

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු සියල්ල සම්බන්ධව අවධානය යොමු කිරීමේදී පැමිණිලි

පාර්ශවය විසින් ප්‍රකාශ කරන පරිදි තම දියණිය 2019 වසරේ හලාවත ශාන්ත මරියා බාලිකා ප්‍රාථමික විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා 24/2018 චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඉදිරිපත් කර ඇති අයදුම් පත්‍රය සහ ඊට අදාලව ඉදිරිපත් කර ඇති අනෙකුත් ලේඛන සලකා බලා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් 71.5 ක ප්‍රමාණයක් ලබාදී ඇති බව නිරීක්ෂණය වන අතර, එම ලකුණු ප්‍රමාණය පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ පැමිණිලිකාරියගේ දියණිය ශාන්ත මරියා බාලිකා ප්‍රාථමික විද්‍යාලයේ 2019 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් බව විමර්ශනයේදී වැඩිදුරටත් අනාවරණය වී ඇත. තවද මෙම පාසල වයඹ පළාත් සභාවට අයත් පාසලක් බැවින් අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කර ඇත්තේ කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරියක වන රේණුකා කොස්තා මිය බව වැඩිදුරටත් අනාවරණය වී ඇත. කලාප අධ්‍යාපන කාර්යාලය වෙනුවෙන් අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ රේණුකා කොස්තා මිය ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකාරියගේ දියණිය ඉහත පාසලේ පළමු ශ්‍රේණියට 2019 වසරේ ඇතුළත් කර ගැනීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඉදිරිපත් කර තිබූ අයදුම් පත්‍රය සහ ඒ සමග ඉදිරිපත් කර තිබූ අනෙකුත් අවශ්‍ය ලේඛන සඳහා ඉහතින් සඳහන් පරිදි ලකුණු 71.5 ක ප්‍රමාණයක් ලබාදී තිබියදී එම දැරිය 2019 වසරේ ඉහත පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගත නොහැකි බවට විදුහල්පති කන්‍යා සොයුරිය විසින් දන්වා සිටීම සහ ඊට හේතුව ලෙස පැමිණිලිකාරිය ඇතුළු පවුලේ සාමාජිකයින් රෝමානු කතෝලික ආගමට අයත් නොවීම යන්න ප්‍රකාශ වී ඇත. කෙසේ වෙතත් මෙහිදී පැමිණිලි පාර්ශවය විසින් තමන් රෝමානු කතෝලික ආගමට අයත් පවුලක් බවට සම්මුඛ පරීක්ෂණයේදී මෙන්ම කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණ අවස්ථාවන් හිදී ද තහවුරු කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. තවද පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කරන පරිදි මෙම පැමිණිල්ලේ විෂය ගත කාරණයට අදාල නොවන සහ 24/2018 චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව පැමිණිලි පාර්ශවය සම්බන්ධව අදාල මීසම භාර පාලක පියතුමා වෙතින් විමසීමක් සිදු කිරීම අවශ්‍ය වන්නේ ද යන කාරණය අවධානයට ලක් විය යුතුය.

**නිරීක්ෂණ සහ නිගමන :-**

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී ඉහතින් සඳහන් කර ඇති කරුණු සැලකිල්ලට ගැනීමේදී පැමිණිල්ල මගින් වගඋත්තරකරු ලෙස නම් කර ඇති විදුහල්පති කන්‍යා සොයුරිය ශාන්ත මරියා බාලිකා ප්‍රාථමික විද්‍යාලය, හලාවත විසින් 2019 වසරේ රජයේ පාසල් වල පළමු ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ චක්‍රලේඛයේ ප්‍රතිපාදන ඉක්මවා යමින් සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ කටයුතු වලට අනිසි බලපෑමක් ඇතිවන ආකාරයෙන් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ සඳහා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, වෙන්නප්පුව සහ හලාවත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ නිලධාරීන් අනියම් ආකාරයෙන් සහයෝගය දක්වා ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය කරමි; ඒ අනුව පැමිණිලි පාර්ශවය වෙත 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති

නීතිය පසිදලීම, ක්‍රියාත්මක කිරීම හා නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය. යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පැමිණිලිකාරියගේ දියණිය වන පී.දිනිති තවෝද්‍යා ප්‍රේමරත්න 2021 වසරේ වගඋත්තරකාර හලාවත ශාන්ත මරියා බාලිකා ප්‍රාථමික විද්‍යාලේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.03.[illegible] වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ආචාර්ය.එම්.එච්.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka
22/02

පිටපත් :

01. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

R/-